නූතන ශබ්ද තාක්ෂණය ඔබේ මේසයට ගෙනන සවුන්ඩ් කාඩ්ස්

Sound Cards' අද යුගයේ පරිගණකයකට නැතිවම බැරි උපාංගයක් බවට පත් වී ඇති බව මෙම ලිපි පෙළේ ආරම්භක ලිපියෙන් පැහැදිලි කළෙමි. Sound Card එකක් නොමැතිව ඔබට පරිගණකයක් මිලදී ගෙන එයින් බොහෝ කටයුතු කරගෙන යාමට කිසිම ගැටළුවක් මතුවන්නේ නැත. නමුත් එය ඇතැම් විට බිහිරි පුද්ගලයෙකුගේ තත්ත්වයේ ඇති උපකරණයක් සේ හැඟේ.

එවැනි පරිගණකයකින්, 'ශබ්දයක්' ලෙස පිටතට පැමිණෙන්නේ, මදර්බෝඩ් හි සවිකර ඇති ඉතා කුඩා ස්පීකරයෙන් පිටවන 'බීප්' හඬ පමණි. එය ප්‍රයෝජනයට ගැනුණේ, හුදෙක් වැඩ සටහන්වල සමහර විධානයන් හා අනතුරු හඟවන පණිවුඩයන් ඔබට ලබා-දීමට පමණි.

Sound Card සංකල්පය, පරිගණක ක්ෂේත්‍රයට පැමිණීමට පෙර යුගයේ පැවති පරිගණක තුළ ද සවිකර තිබුණේ මෙම 'බීප්' හඬ පමණක් නිපදවන තාක්ෂණයයි. එසේම අළුත්ම පරිගණකවල පවා මෙම තාක්ෂණය ඉවත් කර නොමැති බව ද පෙන්වා දෙමි.

Sound Card එකක් සවිකර ඇති පරි-ගණකයකින්, ("බීප්" හඬට අමතරව) ඔබට ඕනෑම හඬක් පිටතට ලබාගෙන එය බාහිර ස්පීකරයක් මගින් ශ්‍රවණය කළ හැකිය. මෙයයි, Sound Card එකකින් කෙරෙන ප්‍රධාන කාර්ය භාරය වන්නේ.Sound Card එකේ මෙම මූලික කාර්යභාරය ප්‍රධාන කොටස් දෙකකට වෙන් කළ හැකිය.

ඔඩියෝ වර්ගයේ සවුන්ඩ් කාඩ්ස්

Creative Labs Sound Blaster Audigy 2 ZS

(1) ශබ්දය පටිගත කිරීම (Sound - Record)

(2) ශබ්දය වාදනය කිරීම (Sound - Playback)

ශබ්දය පටිගත කිරීමේ දී Sound Card හි මෙහෙවර

බාහිර මයික්‍රොෆෝනයක් මගින්, පරිගණකයට ඇතුළු කරන මිනිස් කටහඬක්, ගීතයක් හෝ සංගීතයක්, සංගීත භාණ්ඩයක වාද්‍ය ඛණ්ඩ-යක් හෝ (මයික්‍රොෆෝනයක් රහිතව භාවිතා කරන) ඉලෙක්ට්‍රෝනික සංගීත භාණ්ඩයකින් නිකුත්වන ශබ්දයක් Hard Disk තුළ තැන්-පත් කිරීමේ කාර්යභාරය Sound Card එක ඉටුකරයි. මෙයSound In - Put ලෙස ද හැඳින්වේ.

ශබ්දය වාදනය කිරීමේ දී හෙවත් ශබ්දය ශ්‍රවණය කිරීමේ දීSound Card හි මෙහෙ-වර ඉහත කොටසේ සඳහන් Hard Disk මත පටිගත කළ ඕනෑම ශබ්ද ඛණ්ඩයක් හෝ Hard Disk මත දැනටමත් තැන්පත් වී ඇති පරිගණක වැඩ සටහන්වල අඩංගු ශබ්ද ඛණ්ඩ අපේ කණට ඇසෙන පරිදි ස්පීකර වෙත යැවෙන වගකීම පැවරෙන්නේ දSound Card වෙත ය. මෙය Sound Out - Put ලෙස හැඳින්වේ.

මෙම දෙවන මෙහෙවරේ දී වැදගත් කාරණ කීපයක් මතු කළ යුතුව ඇත.Hard Disk මත හෝ වැඩ සටහන්වල තැන්පත් වී නොමැති ශබ්-දයන් ද ක්ෂණිකව ස්පීකර වෙත ගලා ඒමේ කාර්යය ද Sound Card විසින් ඉටු කරනු ලබයි. මෙය Real - Time Sound Out - Put ලෙස හැඳින්වේ.

මේ සඳහා උදාහරණ දැක්විය හැක.

(1) CD / VCD / DVD ආදී සංයුක්ත තැටි මත අඩංගු වී ඇති කටහඬ, ගීත සහ චිත්‍රපටවල ශබ්දය හෝ පරිගණක ක්‍රීඩාවල ශබ්දය (පටිගත කිරීමකින් තොරව) කෙළින්ම Sound Card ප්‍රොසෙසරය හා පරිගණක ප්‍රොසෙසරය වෙත යවා වැඩි දියුණු කොට ස්පීකර වෙත යැවීමේ කාර්යභාරය.

(2) මයික්‍රෆෝනයකින් හෝ ඉලෙක්ට්‍රෝනික උපකරණයකින් පරිගණකයට ඇතුළු කරන කටහඬ, ගීතය හෝ වාද්‍ය ඛණ්ඩය (පටිගත කිරීමකින් තොරව) කෙළින්ම ස්පීකර වෙත යැවීමේ වගකීම.

(3) පරිගණකයට ඇතැම් විට සවිකරනු ලබන Radio Card, TV Card මගින් අවකාශයෙන් උරාගන්නා සන්නිවේදන තරංග වැඩි දියුණු කොට ශබ්දයන් ලෙස පෙරළා, ස්පීකර වෙත යැවීමේ වගකීම. මෙයින් කීපයකි.

ඉහත සඳහන් කරුණු වලින් Sound Card යනු ඔබේ පරිගණකයට කොතරම් වැදගත් අංගයක් දැයි පැහැදිලි වනු ඇත.

Sound Card ගැන කතා කිරීමේ දී එය මදර් බෝඩ් එක සමග සම්බන්ධ වී ඇති ආකාරය අනුව වර්ග කීපයකට විග්‍රහ කොට දැක්විය හැකිය. ඒ මෙසේය.

(1) මදර් බෝඩ් එකටම සවිකර ඇති Sound Card (On - Board) මේවා වෙනම ගැලවිය නොහැක.

(2) පහසුවෙන් ගලවා, නැවත සවිකළ හැකි ආකාරයට නිපදවා ඇති Sound Card

(3) Sarround Sound ශබ්දය ඇතුළු ශබ්ද තාක්ෂණික ක්‍රම රැසක් අඩංගු නැවත ගලවා සවිකළ හැකි Sound Card.

මෙම ලිපියෙන් විශේෂයෙන් විස්තර වන්නේ මෙම තුන්වැනි කොටසේ සඳහන් Sound Card පිළිබඳවය. සාමාන්‍ය හා අධි තාක්ෂණ Sound Card වලට උචිත වෙළෙඳ නාමයන් කීපයක් පහත දැක්වේ.

1. Sound Blaster Live 5 - 1
2. Delta 410 Pro
3. Typoon - Digital 3D PCI
4. Aureal - Vortex 2 Super Quad Digital PCI
5. Altec Lansing - ACS45-1
6. Labtec - LCS - 2414
7. Diamond - MX 300
8. Guillemot - Maxi - Sound
9. Pine - PCI Digital
10. Videologic - Sonic Fury 3D

කලින් කලට ලොව පුරා විවිධ පරිගණක සමාගම් මගින් විවිධ වර්ගයේ Sound Card නිපදවනු ලබයි.

A LIST OF SOUND BLASTER SOUND CARDS

CREATIVE LABS SOUND BLASTER LIVE 5.1 SOUND CARD
CREATIVE LABS SOUND BLASTER AUDIGY LS 24BIT ADVANCED HD SOUND
CREATIVE LABS SOUND BLASTER AUDIGY 1394 W/FIREWIRE
CREATIVE LABS SOUND BLASTER AUDIGY PAYER
CREATIVE LABS SOUND BLASTER AUDIGY ES PCI SOUND CARD
CREATIVE LABS SOUND BLASTER AUDIGY 2 VALUE SOUND CARD
CREATIVE LABS SOUND BLASTER AUDIGY 2 VARPACK 6.1 SOUND THX 24BIT SOUND CARD
CREATIVE LABS SOUND BLASTER AUDIGY 2 VARPACK 6.1 SOUND THX 24BIT
CREATIVE LABS SOUND BLASTER AUDIGY 2 ZS VARPAK 24BIT ADVANCED HD 8 CHANNEL SOUND CARD
CREATIVE LABS SOUND BLASTER AUDIGY 2 ZS SOUND CARD
CREATIVE LABS SOUND BLASTER AUDIGY 2 ZS GAMER
CREATIVE LABS SOUND BLASTER AUDIGY 2 ZS PLATINUM SOUND CARD
CREATIVE LABS SOUND BLASTER AUDIGY 2 ZS 24 BIT ADVANCED SOUND CARD
CREATIVE LABS SOUND BLASTER AUDIGY 2 ZS PLATINUM PRO SOUND CARD

මෙයින් එක්තරා සමාගමක එක්තරා නිෂ්පාදනයක් පමණක් ලොව පුරා දැවැන්ත ජනප්‍රියත්වයක් අත්කර ගන්නේය. එය කෙතරම් ප්‍රබල විද යත්, අද එය Sound Card ක්ෂේත්‍රයේ සම්මතයක් බවට පත්වී ඇත. එය විස්තර කිරීමට පළමුව ඇපල් හා IBM සමාගමේ මෙම කතාන්තරයට අවධානය යොමු කරමු.

ඇපල් මැකින්ටොෂ් පරිගණක වර්ගයට අමතරව ලෝකයේ ඇති බොහෝ පුද්ගලික පරිගණක එක් කාණ්ඩයකට වෙන් කළ හැකි බව ඔබ දනී. එම කාණ්ඩය IBM පවුලට අයත් පරිගණක (IBM Compatible PC) ලෙස හැඳින්වේ. එයට හේතුව IBM සමාගම ලොවට ඉදිරිපත් කළ තම IBM පරිගණකයේ ක්‍රියාකාරිත්වයට බෙහෙවින් සමාන ලෙස, අනෙක් පරිගණක සමාගම් තම නිෂ්පාදන (පරිගණක හා පරිගණක උපාංග) ඉදිරිපත් කිරීමයි. ඒ අනුව IBM යනු එක්තරා මිමිමක් හෙවත් සම්මතයක් බවට අද පත් වී ඇත. Sound Card සම්බන්ධයෙන් ද මෙවැනි පවුලක් හා සම්මතයක් ගොඩනැගී ඇත.Creative Labs නම් සමාගම විසින් "Sound Blaster" නම් Sound Card එක නිපදවීමත් සමග මේ තත්ත්වය ඇතිවිය.

Sound Card ඉතිහාසයේ මුල් අවධියේ සිටම තම ඩෂ්පාදන ඉතා උසස් මට්ටමින් එළිදැක්වීමත්, ශබ්දය සම්බන්ධ අමතර උපාංග (ස්පීකර, පරිගණක ක්‍රීඩා) ආදිය ආරම්භයේ සිටම එකවර වෙළෙඳ පළට නිකුත් කිරීමත් මෙයට හේතුවන්නට ඇත.

"Sound Blaster" Sound Card

Sound Blaster කාඩ්පත ලෝකයේ ඇති උසස්ම Sound Card එක නොවීමට පුළුවන.එයට අධි තාක්ෂණික Sound Cards විශේෂ කාර්යයන් සඳහා අදටත් නිෂ්පාදනයේ පවතී. නමුත් වෙළෙඳ පළ විශාල ලෙස ග්‍රහණය කර ගැනීම නිසා Sound Blaster කාඩ්පත සම්මතයක් බවට පත්වී තිබේ.



Audigy2-ZS Platinum Pro **සමග ලැබෙන සවුන්ඩ් කාඩ්පත, හබ් එක සහ රිමෝට් පාලකය**